**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය - 79**

**ආයතනයේ නම - සෞඛ්‍ය අමාත්‍යාංශය**

**පළමු කොටස - 67.00**

| | කාර්යසාධන ඇගයීම ප්‍රකාරව කාරක සභාව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා | දුර්වලතා නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ පියවර හා වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 1 | හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින රෝහල් හා ආයතන විසින් වෙන් වෙන් වශයෙන් හානි පිළිබඳ ලේඛණ යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබයි. |
| 2 | අවදානම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නැත. | අවදානම් ලේඛනයක් පවත්වා ගෙන යනු නොලැබේ. |
| 3 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | විගණන විමසුම් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඊට අදාල අනෙකුත් රෝහල් හා ආයතන වෙත යොමුකර පැහැදිලි කිරීම් ලබාගත යුතු අතර එලෙස පිලිතුරු ගෙන්වා ගැනීමේදී යම් කාල පමාවක් සිදුවන අතර හැකි සෑම අවස්ථාවකදීම නියමිත කාලය තුල පිලිතුරු ලබා දීම සඳහා කටයුතු කරනු ලැබේ. |
| 4 | අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා වාර්තා විය. | අභ්‍යන්තර විගණන පරීක්ෂණයකින් පසු නිකුත් කරනු ලබන අභ්‍යන්තර විගණන වාර්තා අදාල ආයතනය වෙත ලැබී මසක් ඇතුලත පිලිතුරු ඉදිරිපත් කල යුත බවට සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් සියළුම රෝහල හා ආයතන දැණුවත් කර ඇත.<br>ඒ අනුව වර්තමානය වන විට විගණන වාර්තා යොමු කරනු ලැබූ ආයතන අතරින් සැලකිය යුතු ආයතන ප්‍රමාණයක් විසින් පිලිතුරු ලබා දී ඇත.<br>එසේම පළාත් මට්ටමින් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කර ඇති බැවින් පළාත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදීද අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් ඇතුලත පිලිතුරු ලබාදෙන ලෙස රෝහල් අධ්‍යක්ෂවරුන් දැණුවත් කිරීමට කටයුතු කර ඇත. |
| 5 | සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනා කරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබුණි. | නොවැළැක්විය හැකි හේතූන් මත 2022 වර්ෂය තුල නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය නොහැකි වුවද 03ක් පමණක් පවත්වා ඇත. 2023 වර්ෂයේ සිට චක්‍ර ලේඛ විධිවිධාන අනුව නියමිත පරිදි කාර්තුවකට 01 බැගින් කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| | | 2024 වර්ෂ සඳහා මේ වන විට 2024.03.21 හා 2024.07.26, 2024.11.06, 2024.12.09 හා හතරවන කාර්තුවට අදාල කමිටු රැස්වීම්ද 2025.01.31 දින පවත්වන ලදී.<br>පළාත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්ද 2024 වර්ෂය තුළ චක්‍රලේඛනානුකූලව කාර්තුවකට 01 බැගින් පැවැත්වීම සඳහා නිරන්තරයෙන් අදාල කමිටු සභාපතීන් වෙත උපදෙස් ලබා දී ඇත. මේ වන විට 03 වන කාර්තුවට අදාල සියළුම පළාත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා අවසන් කර ඇති අතර පළාත් කිහිපයක 04 වන කාර්තුවට අදාල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්ද පවත්වා අවසන් කර ඇත. 2024 වර්ෂයේ 04 වන කාර්තුවට අදාල පළාත් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා අවසන් කරන ලෙසට ඉතිරි පළාත් කමිටු සභාපතීන්ද දැනුවත් කර ඇත. |
| 6 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශ ද අනෙකුත් නිර්දේශ ද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශ පොදු චක්‍රලේඛ අංක 01-38/2024 හා 2024.10.22 දිනැතිව සෞඛ්‍ය අමාත්‍යාංශ ය හා ඒ යටතේ වන රෝහල් හා ආයතන වෙත උපදෙස් ලබා දී ඇත.<br>මෙම චක්‍රලේඛය මඟින්,<br>භාණ්ඩ සමීක්ෂණය සිදුකල යුතු කාල රාමුව, භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම, වාර්තා ඉදිරිපත් කිරීම, මූල්‍ය නොවන වත්කම් සත්‍ය හා සාධාරණ ලෙස අවසන් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව ක්‍රියාකිරීම, බඩු පරීක්ෂණ/සෝදිසි යනාදිය, පාවිච්චි කල නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, අපහරණ මණ්ඩල පත් කිරීම හා අපහරණය කරනු ලබන භාණ්ඩ පොත් වලින් ඉවත් කිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දී ඇත. |
| 7 | සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත. | සෞඛ්‍ය ලේකම්/ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් තනතුරු නාම යටතේ ලියාපදිංචි මේ වන විට ලියාපදිංචි සහතික නොමැති වාහන සඳහා එම වාහන වල ලියාපදිංචි සහතිකයේ උදෘතයන් ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, ලියාපදිංචි සහතික වල මුල් පිටපත් ලබා ගැනීම සම්බන්ධව කටයුතු කරමින් පවතී. |
| 8 | සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබුණි. | සියළු සංචිත වාහන සඳහා රාජ්‍ය ලාංඡනය ඇලවීම සිදු කර ඇති අතර නිලධාරීන් වෙත අනුයුක්ත වාහන වලට රාජ්‍ය ලාංඡන ඇලවීම සම්බන්ධව කටයුතු සිදු කරමින් පවතී. |
| 9 | වාහනයක් ගර්හිත වී මාස 8 වඩා අඩු කාලයකදී අපහරණය කර නොතිබුණි. | 2024 ජනවාරි මාසයේදී සිදු කරන ලද වෙන්දේසියෙන් පසු අපහරණය කිරීම සඳහා රැගෙන එන ලද වාහන අපහරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව තක්සේරු කමිටුව වෙත ඉදිරිපත් කර ඇත.එම වාර්තාව ලද පසු වෙන්දේසි කිරීමේ කටයුතු සිදු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| | | වෙන්දේසි කිරීමේදී වාහන යම් ප්‍රමාණයක් එක්රැස් කර වෙන්දේසි කිරීම සිදු කරනු ලබන බැවින් ඒ සඳහා යම් කාලයක් ගතවන නමුත් ඉදිරියේදී පළාත් මට්ටමින් වෙන්දේසි කටයුතු සිදුකර හැකි ඉක්මණින් එම කාර්යය අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| 10 | රජයේ වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි කටයුතු කර නොතිබුණි. | මේ වන විට වාහන අනතුරු සම්බන්ධයෙන් මු.රෙ. ප්‍රකාරව නිසි පරිදි කටයුතු කර ලේඛණයක් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ. |
| 11 | මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබුණි. | සෞඛ්‍ය සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම වෙනුවෙන් බොහොමයක් රෝහල් මෙලෙස ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම් වලට එළඹ ඇත. මහා භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන ප්‍රමාණවත් ලෙස අනුමත නොකිරීම නිසා මෙවැනි තත්ත්වයක් උදා වී ඇත. කෙසේ වෙතත් ප්‍රතිපාදන ඉක්මවා බැරකම් ඇති කර නොගන්නා ලෙසට අදාල නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. |
| 12 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතුණි. | 2024.12.31 දින වන විට වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂය රු. මිලියන 90.928 කි. කෙසේ වෙතත් වසරකට වැඩි හිඟ ණය ශේෂයන් අයකර ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් රෝහල් හා ආයතනයන් වෙත ලබා දී ඇති අතර මෙම වර්ෂය තුලදීද හැකි පමණින් හිඟ ණය ශේෂයන් අයකර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබා දීම් හා පසුවිපරම් සිදු කරනු ලැබේ. |
| 13 | පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වසර 02 ඉක්මවූ පොදු තැන්පත් ශේෂ මු.රෙ.571 ප්‍රකාරව නිරවුල් නොකිරීමට හේතු වී ඇත්තේ තැන්පත්කරුවන් විසින් මෙතෙක් ඉල්ලීම් ඉදිරිපත් නොකිරීම, නිතිමය කටයුතු අවසන් නොවීම හා අදාල තැන්පතු තව දුරටත් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගනීමට සිදුවීම යන කරුණු මතයි.<br>මෙම තැන්පතු බොහොමයක් ගොඩනැඟිලි අංශයට අදාල වන අතර එම තැන්පතු ගොඩනැඟිලි ඉදිකිරීම් වලට අදාලව තැන්පත් කරන ලද රඳවා ගැනීම් වන අතර මින් බොහොමයක් කොන්ත්‍රාත් ආයතනයන් විසින් මෙතෙක් ඉල්ලීම් ඉදිරිපත් නොකල ඒවා වේ.<br>කෙසේ වෙතත් වසර 02 ක ඉක්මවූ පොදු තැන්පත් ශේෂ මු.රෙ.571 ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස කරන ලද දැණුවත් කිරීම් අනුව අමාත්‍යාංශ ප්‍රධාන කාර්යාලයට අදාලව පොදු තැන්පත් ගිණුමේ ගොඩනැඟිලි අංශයට අදාලව පවතින රඳවුම් මුදල් වලින් මෙතෙක් ලබාදෙන ලෙස ඉල්ලීම් සිදු නොකරන ලද 2015 වර්ෂයට අදාලව රු. 7,326,873.20 ක් 2025 ජනවාරි මස රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇත. එමෙන්ම වසර 02 ඉක්මවූ ඉතිරි වර්ෂ වල රඳවුම් මුදල්ද 2025 වර්ෂය තුලදී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| | | එසේම රෝහල් කිහිපයක් විසින් මේ වන විට පොදු තැන්පත් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කර ඇත. |
| 14 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර නොතිබුණි. | මු.රෙ.371(5) සහ රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 අනුව අත්තිකාරමක් ලබාගෙන ඊට අදාල කාර්යය අවසන්කොට දින 10 ක් තුල එම අත්තිකාරම පියවීමට කටයුතු කල යුතු බවත් අත්තිකාරම් මුදල් ලබාගත් කටයුත්ත අවලංගු වුවහොත් නැවත පියවීම් සිදුකර අත්තිකාරම් මුදල් නැවත ඉල්ලුම් කර අදාල කාර්යය ඉටු කර ගන්නා ලෙසටත් එක් එක් අංශ දැණුවත් කර ඇත. එසේම තත්කාර්යය අතුරු අග්‍රිමය ලබාගෙන එවැනි අග්‍රිම දෙකක් පියවා නොමැති නිලධාරීන්ට නැවත අග්‍රිම නිකුත් නොකල යුතු බවටද මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීමේදී දැණුවත් කර ඇත. |
| 15 | රැස්කළ ආදායම් අදාළ විධි විධාන වලට අනුකූලව ආපසු ගෙවා නොතිබුණි. | මුදල් රෙගුලාසි හා චක්‍ර ලේඛයන් ප්‍රකාරව ආදායමින් අපසු ගෙවීම් සිදු කරන ලෙස සියළු ආයතන දැණුවත් කර ඇත. ඒ අනුව මේ වන විට සියළු ආයතන විසින් විධිමත් පරිදි අනුමැතිය ලබාගෙන ආදායමෙන් ආපසු ගෙවීම සිදු කරනු ලැබේ. |
| 16 | රැස්කර තිබුණු ආදායම්, සෘජුවම ආදායමට බැර කර හෝ ඒවා තැන්පත් ගිණුමේ රඳවා ගෙන මාසයකට වඩා අඩු කාලයක් ඇතුළත ආදායම් ගිණුමට බැර කර හෝ නොතිබුණි. | එක් එක් රෝහල් හා ආයතන විසින් රැස් කරනු ලබන ආදායම් සෘජුවම ආදායමට බැර කිරීමටත්, එසේ නොවන අවස්ථාවලදී ඒවා පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන මාසයකට අඩු කාලයක් ඇතුලත ආදායම් ගිණුම බැර කරන ලෙසටත් සියළුම රෝහල් හා ආයතන වලට උපදෙස් ලබා දී ඇත. |
| 17 | අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩල බඳවාගෙන තිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ වන රෝහල් හා ආයතන සඳහා අවශ්‍ය තනතුරු ඇති කිරීම හෝ වෙනස් කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර කාර්ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 18 | 2017.09.20 දිනැති 2017 අංක 4 දරන කළමනා කරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසාන වී මාසයක් ඇතුලත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම සෑම වර්ෂයකම ජූනි 30 හා දෙසැම්බර් 31 දිනට සිදු කරනු ලැබේ. මෙම යාවත්කාලීන කිරීම වඩා කාර්යක්ෂමව හා කඩිනමින් සිදු කිරීම සඳහා මාර්ගගත ක්‍රමය හරහා තොරතුරු ලබා ගැනීමට ක්‍රමවේදයක් සකස් කර ඇත. ඒ අනුව 2024 ජූනි 30 දිනට අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබාගෙන ඇති අතර එම විස්තර සෞඛ්‍ය අමාත්‍යාංශ වෙබ් අඩවියේ පලකර ඇත.<br>එසේම 2024 දෙසැම්බර් 31 දිනට අදාල තොරතුරුද මාර්ගගත ක්‍රමය ඔස්සේ ලබා ගැනීමටද කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. |

දෙවැනි කොටස - **39.00**

| | කාර්යසාධන ඇගයීම ප්‍රකාරව කාරක සභාව විසින් හඳුනාගනු ලැබූ දුර්වලතා | දුර්වලතා නිවැරදි කිරීම සඳහා ගනු ලැබූ පියවර හා වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01 | 2018.01.24 දිනැති අංක 05/2018(1) දරන චක්‍ර ලේඛයෙන් සංශෝධිත 2008.02.06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි / සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | පුරවැසි /සේවා ලාභී ප්‍රඥප්තිය සකස් කර එහි සිංහල පිටපත අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පලකර ඇත. |
| 02 | ආයතනයේ පුරවැසි සේවා ලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධීක්ෂණය කිරීමට හෝ ඇගයුමට භාජනය කිරීමට ක්‍රම වේදයක් සකස් කර නොතිබුණි. | අමාත්‍යාංශයට අදාල පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳව ගැටළු පවතින්නේ නම් ක්ෂණික ඇමතුම් 1907 ඔස්සේද Whatsapp අංක 0707907907 ඔස්සේද විද්‍යුත් තැපැල් ලිපින suwasawana@health.gov.lk ඔස්සේ දැණුම්දිය හැකිය. එසේම අමාත්‍යාංශ දුක්ගැනවිලි සම්බන්ධීකරණ ඒකකය වෙත දැණුදිය හැකි අතර , ප්‍රඥප්තිය සම්බන්ධයෙන් යෝජනා/චෝදනා වේ නම් දුරකථන අංක 0112670182 ඔස්සේද ෆැක්ස් අංක 0112693866 ඔස්සේද විද්‍යුත් තැපැල් ලිපින sasinformation@health.gov.lk ඔස්සේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවෘත්ති හා ප්‍රචාරණ) වෙත දැණුම්දීමේ හැකියාව සකස් කර දැණුවත් කිරීම් සිදුකර ඇත. |
| 03 | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධි විධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත කාර්යාලය මඟින් (WHO Sri Lanka) කොළඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයට සම්බන්ධ විශේෂඥ කමිටු දායකත්වය ලබාගෙන සෞඛ්‍ය මානව සම්පත් සංවර්ධන ක්‍රමෝපායන 2020-2030 (HRH Strategic Plan 2020-2030) සකසා අවසන් කෙටුම්පත් අවස්ථාවේ පවතී.<br>ශ්‍රී ලංකාව මුහුණ දුන් සමාජ ආර්ථික අභියෝගයන් සහ එම අභියෝගයන් හේතුකොටගෙන මානව සම්පත් කළමනාකරණය ඇතුළු නව ප්‍රවනතා සැලකිල්ලට ගෙන සකස් කරන ලද කෙටුම්පත් මානව සම්පත් සැලැස්ම යාවත්කාලීන කිරීම සහ ඒ මත පදනම්ව 2025-2035 සඳහා වන නව මානව සම්පත් ක්‍රියාකාරී සැලැස්මක් පිලියෙල කිරීමටත් මේ වන විට මූලික කටයුතු සිදු කෙරෙමින් පවතී.<br>මේ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදනද දැනටමත් ලැබී ඇති බැවින් අදාල සැලසුම් කඩිනමින් සකසා අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. |

| | | |
|---|---|---|
| 04 | සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් කාර්ය මණ්ඩලයෙන් සියයට 50 කට වැඩි පිරිසකට වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සහතික කර නොතිබුණි. | දිවයින පුරා පිහිටි සියළුම සෞඛ්‍ය ආයතන හා රෝහල්හි සෞඛ්‍ය කාර්ය මණ්ඩලය 150,000 කට අධික වේ. එහෙත් පුහුණු වැඩසටහන් සඳහා ලබාදෙනු ලබන මිලියන 50ක් වන ප්‍රතිපාදන ප්‍රමාණය, සේවාස්ථ පුහුණු පාඨමාලා පමණක් නොව මූලික පුහුණු පාඨමාලාවන් 15ක් සඳහා වන වියදම් හා අනෙකුත් පුහුණු කාර්යයන් සඳහා වන වියදම්ද ආවරණය කිරීමට සිදු වේ. එබැවින් සෞඛ්‍ය ආයතන වෙතින් පුහුණු අවස්ථා සඳහා කරනු ලබන ඉල්ලීම සම්පූර්ණ කිරීම අපහසු වේ.<br>කෙසේ වුවද 2022 වර්ෂයේදී 6175 දෙනෙකු සඳහා පුහුණු අවස්ථා සලසා දුන් අතර 2023 වර්ෂයේදී වෙනත් වැය විෂයන් මගින්ද ප්‍රතිපාදන ලබාගනිමින් 10147 දෙනෙකු සඳහා පුහුණු අවස්ථා ලබා දීමට කටයුතු කරන ලදී.<br>ඉලක්කගත අරමුණු සඳහා ළඟා වීමට වාර්ෂික ආංශික සැලැස්මට අනුව මිලියන 300 ක පමණ ප්‍රතිපාදන අවශ්‍යතාවයක් පවතී.<br>2025-2035 සඳහා වූ නව මානව සම්පත් ක්‍රියාකාරී සැලැස්ම සඳහා මෙම යෝජනාව ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| 05 | සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. | රා.ප.ව. 02/2018 හා 2018.01.24 දිනැති චක්‍රලේඛය මඟින් ආයතනයේ සේවයේ නියුතු සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධයෙන් මාගේ අංක CA/GCE/විවිධ නියෝග/01/2022 හා 2022.03.23 දිනැතිව සියළුම අංශ ප්‍රධානීන් දැනුවත් කර ඇත. ඒ අනුව 2022 වර්ෂයේ සිට වාර්ෂික වැටුප් වර්ධක අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමේදී වාර්ෂික කාර්ය සාධන ගිවිසුමද ලබා ගැනීමට කටයුතු කරන ලදී.<br>පසුව රා.ප.ව.02/2018 චක්‍රලේඛයට සංශෝධනයක් ලෙස රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අංක 02/2018 (1) හා 2023.11.30 දිනැති චක්‍රලේඛය අනුව 02/2018 (1) හි 03 වන ඡේදයේ උපදෙස් අනුව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව දන්වා ඇති බැවින් එදින සිට කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීම නවතා ඇත. |
| 06 | මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ආයතනය තුළ ජ්‍යෙෂ්ඨ නිලධාරයෙකු නම් කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැසුම් සකස් කිරීමට ද ධාරිතා හා නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ ඒකකයේ අධ්‍යක්ෂ වන වෛද්‍ය සමන්ත රණසිංහ මහතා මේ සඳහා පත්කර ඇත. |
| 07 | ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ / ව්‍යාවන මට්ටමේ / අහිතකර මට්ටමේ විය. | විගණන මතය සඳහා පදනම් වූ දුර්වලතා නිවැරදි කිරීමට පියවර ගෙන ඇත. |
| 08 | විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | විගණකාධිපති වාර්තාව මඟින් ලබා දී ඇති විගණකාධිපති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාලව එක් එක් අංශ හා නිලධාරීන් |

| | | |
|---|---|---|
| | | දැණුවත් කර ඇති අතර අදාල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් සිදු කරනු ලැබේ. |
| 09 | රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ/ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි. | සෞඛ්‍ය අමාත්‍යාංශය සම්බන්ධයෙන් පැවති රජයේ ගිණුම් කාරක සභාවන්හිදී ලද නිර්දේශ / නියෝග ක්‍රියාත්මක කිරීමට අදාලව එක් එක් නියෝග/ නිර්දේශ සම්බන්ධයෙන් අදාල අංශ හා නිලධාරීන් දැණුවත් කර ඇති අතර නියෝග / නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසුවිපරම් සිදු කරනු ලැබේ. |
| 10 | නිලධාරීන්ගෙන් රජයට සිදු වූ පාඩු වෙනුවෙන් මු.රෙ.156 ( 1 ) ප්‍රකාරව අය කිරීම් කර නොතිබුණි. | පොදු චක්‍රලේඛ අංක 01-38/2024 හා 2024.10.22 දිනැතිව අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.<br>එමෙන්ම මූලික පරීක්ෂණ මණ්ඩල සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසාදීම හා මූලික කටයුතු සඳහා සහාය ලබා දීම සිදු කරමින් පරීක්ෂණ මණ්ඩල මඟින් ලැබෙන නිර්දේශ ප්‍රකාරව අයකිරීම සම්බන්ධ පසුවිපරම් සිදු කරනු ලබයි. |
| 11 | මු.රෙ. 119 ප්‍රකාරව අය කළ යුතු අධිභාර අයකර නොතිබුණි. | පොදු චක්‍රලේඛ අංක 01-38/2024 හා 2024.10.22 දිනැතිව අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.<br>එමෙන්ම මූලික පරීක්ෂණ මණ්ඩල සඳහා අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සලසාදීම හා මූලික කටයුතු සඳහා සහාය ලබා දීම සිදු කරමින් පරීක්ෂණ මණ්ඩල මඟින් ලැබෙන නිර්දේශ ප්‍රකාරව අයකිරීම සම්බන්ධ පසුවිපරම් සිදු කරනු ලබයි. |
| 12 | උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි. | 2023.12.04 දිනැති අභ්‍යන්තර සටහන මඟින් අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිටින සියළුම රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, කාර්යාල කාර්ය සහයක හා සෞඛ්‍ය කාර්ය සහයක නිලධාරී මහත්ම මහත්මීන්ගේ සේවා තොරතුරු කැඳවා අභ්‍යන්තර ස්ථාන මාරු කමිටු නිර්දේශ අනුව 2024.04.23 දින අභ්‍යන්තර ස්ථාන මාරු නියෝග ලබාදෙන ලදී. නමුත් මෙම ස්ථාන මාරු ක්‍රියාවලිය සම්බන්ධයෙන් මතු වූ ගැටළු සහගත තත්වයක් හේතුවෙන් 2024.07.23 දිනැතිව අවලංගු කරන ලදී.<br>නමුත් අවුරුදු 05ට වැඩි කාලයක් එකම අංශයක සේවය කරන ලද නිලධාරීන් නැවත අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම සඳහා වර්තමාන සෞඛ්‍ය ලේකම්ගේ අනුමැතිය ලැබී ඇත. එම උපදෙස් පරිදි අභ්‍යන්තර ස්ථාන මාරු සිදු කිරීම සඳහා ස්ථාන මාරු කමිටුවක් පත් කිරීම සිදු කල යුතු අතර එය පත් කිරීමෙන් අනතුරුව ලැබෙන නිර්දේශ මත අභ්‍යන්තර ස්ථාන මාරු සිදු කිරීමට නියමිතය. |

වෛද්‍ය නලින්ද ජයතිස්ස ,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය.

වෛද්‍ය නලින්ද ජයතිස්ස (පා.ම.)
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍ය
ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.
අංක 385. "සුවසිරිපාය".
පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත.
කොළඹ 10.